## වෂර් 2022 ක්වු පෙබරවාරි මස 22 වන දින උඩපළාත ප්‍රාදේශීය සභා මහ සභා රැස්වීමේ වාතර්ාව

වේලාව - පෙරවරු 10.00

- ❖ පැමිණීම

| | |
|---|---|
| 01.D.Gගුණසේන මහතා | ගරු සභාපතිතුමා |
| 02.L.N අසේල අමරසේන මහතා | ගරු උප සභාපතිතුමා |
| 03.R.M කීතරී රත්නායක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 04.A.ධමර්සිරි අගලවත්ත මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 05..S.A නවරත්න බණ්ඩා මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 06.U.G පාලිත මහින්ද ජිනදාස මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 07.M.G මොහොමඩ් මුරාඩ් මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 08.M.G.R පාලිත අබේරත්න මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 09. D.G ජයන්ත කීතරීසිංහ මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 10.R.M රවින්ද්‍ර දිනුක රත්නායක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 11. A.C මොහොමඩ් ෆසාල් මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 12.R.M උදයකුමාර දිසානායක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 13.W.ප්‍රේමතිලක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 14.A.H.A රත්නායක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 15. R.M ප්‍රේමරත්න බණ්ඩාර මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 16. 15.H.M නීල් සුගත් කුමාර මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 17. W.D.G ගුණතිලක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 18.H.M යසස් බණ්ඩාර දෙනුවර මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 19. 21.R.G රන්ජන් රාජපක්ෂ මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 20. G.A අරුණ ප්‍රසන්න මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 21.මුතු නීලමේගම් මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 22.තංගවේලු කාමරාජන් මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 23.කුමාරවේලු කනගරත්නම් මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |

24.H.G සුසිලාවති මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

25.P.T.G වයලා විනෝදනි චන්ද්‍රපාල මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

26.W. ඩිමෝෂි ඥාණලතා මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

27.K.W කෝකිලා කුමාරි වරාහේන මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

28.R චමිලා ෆොන්සේකා මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

29.H.G සුභද්‍රා සමරනායක මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

30.පිච්චෙයි සෙල්වපූනේස්වරී මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

31.N.R.M.D නවරත්න රත්නායක මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

32.ගයානී ශ්‍රියාමාලා ඇතුගල්පේ මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

33.චාමික රුවන් දසනායක මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

<u>සභාවට නොපැමිණි මන්ත්‍රීවරුන්</u>

34. M.G.W.C.B වේරපිටිය මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

35. M.G උපචන්ද්‍ර ජයපති මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

36. D.W.G හේමකුමාර නයනානන්ද මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

37.D.M දීසායු මංජුල දිසානායක මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

38.A ධනුෂ්ක ඉන්ද්‍රජිත් මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

39.A. සමන්ත කුමාර ආරියදාස මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

40. D. ප්‍රසන්න මනෝජ් තිලකරත්න මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

41. වත්සලා චතුරාණි සේනානායක මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

42.සෙල්වරාජ් කාතරීකා මෙනෙවිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

43.K සුප්පයියා ජීවා මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

පෙරවරු 10.00ට සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදි.

<u>1.පසුගිය මහසභාවේ සභා වාර්ථාව සභා සම්මත කිරිම</u>

පසුගිය ජනවාරි මස 25 වන දින මහ සභා වාර්ථාව සභා සම්මත කර ගැනීම.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

2021 ජනවාරි මස 25 වන දින මහ සභා වාර්ථාව සභා සම්මත කරන ලෙසට මම යෝජනා කරමි.

ගරු ජයන්ත කීතරීසිංහ මන්ත්‍රීතුමා

පසුගිය මස මහ සභා වාර්තාව සත්‍ය වාර්තාවක් ලෙස පිළිගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු ඩිමෝෂි ඥාණලතා මන්ත්‍රීතුමිය

පසුගිය මස මහ සභා වාර්තාව සත්‍ය වාර්තාවක් ලෙස පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

*මෙහිදී අත් ඔසවා සියළු දෙනාම එකඟතාවය පල කරන ලදි.*

*ඒ අනුව සභා වාර්තාව ඒකමතිකව සභා සම්මත වන බව මම සදහන් කරමි.*

2. ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදන

2.1. ආදේශක පුස්තකාල සහයිකාවන් දෙදෙනාගේ සේවය තවදුරටත් ලබාගැනීම සම්බන්ධව වූ යෝජනාව 2022.01.25 දින මහ සභා අනුමැතියට ඉදිරිපත් කරන අවස්ථාවේදී මේ සමබන්ධයෙන් උඩපළාත ප්‍රාදේශීය සභාව මඟින් අවශ්‍ය කටයුතු ඉටු කර නොමැති බව මහ සභාවේදී සදහන් කල අතර ඒ සම්බන්ධව ඉල්ලීම් කරමින් යවා ඇති ලිපි මහ සභාවට ඉදිරිපත් කරමින් එසේම තවද කළමනාකරණ සේවා දෙපාතර්මේන්තුව මඟින් අනුමත කර ඇති කාය්ර් මණ්ඩලයේ මෙම තනතුරු දෙක නොමැති බවත් මෙම තනතුරු දෙක ඇතුළත් කර දෙන ලෙස කිහිප විටක් ඉල්ලීම් කල බවත් මෙතෙක් එය ඉටු නොවූ බවත් අනුමත කාය්ර් මණ්ඩලය වෙනස් කිරීමට බලයක් අපට නොමැති බවත් සේවා අවශ්‍යතාවය සලකා බලා අනියම් පදනමින් බදවා ගන්නා ලෙස ඉල්ලීම් කල බවත් ඒ සම්බන්ධ වූ ලි වල පිටපත් මේ සමඟ මහ සභාවට ඉදිරිපත් කරන බව සදහන් කරමින් ලේකම්තුමිය විසින් ඉදිරිපත් කර ඇති ලිපිය සම්බන්ධ වූ නිවේදනය සභාගත කරන ලදි.

තව මාස හයක් සදහා ආදේශක පුස්තකාල සහයිකාවන් දෙදෙනාගේ සේවය තවදුරටත් ලබාගැනීමට අනුමැතිය ලැබී ඇති බවත් ඉන් අනතුරුව නැවත ඉල්ලීම් ඉදිරිපත් කල යුතු බවත් සදහන් කරන ලදි.

2.2.උඩපළාත ප්‍රාදේශීය සභාවේ 2021 වෂර්යේ ක්‍රියත්මක කරන ලද කමර්ාන්ත කිහිපයක් සම්බන්ධයෙන් සිදු කල නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය වූ කරුණු සදහන් කරමින් ජාතික විගණන කාය්රාලය මඟින් එවා ඇති ලිපිය **සම්බන්ධයෙන් වූ නිවේදනය සභා ගත කරන ලදි.**

2.3.PB-7657 අංක දරණ කෲ කැබ්රථයේ අළුත්වැඩියාව සහ නඩත්තු ලිපිගොනුව පරීක්ෂා කිරිමෙන් අනතුරුව පැහැදිලි කරගත් කරුණු **සම්බන්ධයෙන් වූ නිවේදනය සභා ගත කරන ලදි.**

3. සභාව වෙත එවා ඇති සංදේශ/පෙත්සම්/පැමිණිලි/සන්නිවේදන ලිපි සභාවට ඉදිරිපත් කිරිම

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා
**සංදේශ/පෙත්සම්/පැමිණිලි/සන්නිවේදන ලිපි නොමැති බව සදහන් කරන ලදි.**

4.කල් දී ඇති ප්‍රශ්න **- නොමැති බව සදහන් කරන ලදි.**

5.කල් දී ඇති යෝජනා

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

තීරණ අංක 05.1 (1)

5 (1.1) බුම්මලේ සුසාන භූමියෙහි ආදාහනාගාරයක් ඉදිකිරීමේ කමිටුව සදහා සාමාජිකයෙකු වශයෙන් නඩර් ආයතනයේ ඉංජිනේරු උදය පරනගම්පොල මහතා පත්කර ඇති අතර කමිටු රැස්වීමට සහභාගී වී එක් දිනක

සේවාව ලබාදීම සඳහා රු.20,444.40ක මුදලක්(8% වැට්බදු සහිතව) ගෙවිය යුතු බවත් එම මුදල ගෙවීම සඳහා මහ සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු පාලිත අබේරත්න මන්ත්‍රීතුමා</u>

එක් එක් නිළධාරින්ට ගෙවීම් කටයුතු කිරීම සඳහා අදාළ චක්‍රලේඛ පවතින බව සඳහන් කරන ලදි.

<u>ගරු කීතරී රත්නායක මන්ත්‍රීතුමා</u>

බුම්මලේ සුසාන භූමියෙහි ආදාහනාගාරයක් ඉදිකිරීමේ කමිටුව සඳහා සාමාජිකයෙකු වශයෙන් පත් කර ඇති නඩර් ආයතනයේ ඉංජිනේරු උදය පරනගම්පොල මහතාට කමිටු රැස්වීමට සහභාගී වී එක් දිනක සේවාව ලබාදීම සඳහා රු.20,444.40ක මුදලක්(8% වැට්බදු සහිතව) ගෙවීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි.

<u>ගරු අගලවත්ත මන්ත්‍රීතුමා</u>

දැනට කිසිදු ගෙවීමක් කර නොමැතිද යන්න විමසන ලදි.

<u>ගරු පාලිත අබේරත්න මන්ත්‍රීතුමා</u>

රජයේ රැස්වීම් සඳහා නිළධාරින් සහභාගී වන විට එම අයට ගෙවීම් කරන චක්‍රලේඛ ඇති බවත් මෙහිදී ඉංජිනේරු මහතාට කරන ගෙවීම චක්‍රලේඛ වලට පරිභාහිර දැයි විමසන ලදි.එක් දිනකට රු.20,444.40 ගෙවීම් සිදුකරන නිළධාරියා කවුරුන්ද යන්න ගැටළුවක් බවත් මොනවා උනත් නිළධාරියෙකුට අපි රු.7000.00, රු.4000.00 බැගින් ගෙවීම් කරන බවත් එසේම මෙම මුදල සඳහන් කර ඇත්තේ ප්‍රවාහන ගාස්තුව සමඟම විය හැකි බවද සඳහන් කරන ලදි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

දොළුව පුස්තකාලයට පැමිණි නිළධාරියාටද අපේ මහ සභාවේ අනුමත කරගෙන රු.20000.00 මුදලක් ගෙවන ලද්දේ එම නිළධාරි මහතා කුලියාපිටිය ප්‍රදේශයේ සිට පැමිණි නිසා බවද සඳහන් කරන ලදි.එසේම මෙම මුදල තවම ගෙවා නොමැති බවත් කමිටුවක් තිබුනොත් පමණක් ගෙවීම් කටයුතු කරන බවත් සඳහන් කරන ලදි.

<u>ගරු උප සභාපති අසේල අමරසේන මහතා</u>

මෙම නඩර් ආයතනය අධර් රාජ්‍ය ආයතනයක් බවත් මෙම මුදල ගෙවීමට පෙර කමිටුවක් පවත්වන බවත් ඉන් අනතුරුව ගෙවීම් කරන බවත් රුපියල් කෝටි දෙකක පමණ වැඩ කටයුත්තක් ඉටු කරන බවත් රාජ්‍ය ආයතනයකද තනතුරු සඳහා යම් කිසි තක්සේරුවක් පවතින බවත් ඉංජිනේරු,වෛද්‍ය වැනි තනතුරු සාමාන්‍ය නොවන බවත් එම අය එම අයගේ අධ්‍යාපන මට්ටම් මත අය කිරීම් සිදු කරන බවත් මෙම ආයතනයේ අනුමැතියට යටත්ව ලිපි ගණුදෙනු සිදු ඇති බවත් මෙහිදී යම්කිසි ගෙවීමක් සිදු කරනවා නම් කමිටුවක් පැවතුන පසු කොමසාරිස්තුමාගේ අනුමැතියට යටත්ව මෙම මුදල් ගෙවන බවත් සභාවක් ලෙස අපි තීන්දු කරගත් පසු නීත්‍යානුකූලව කොමසාරිස්තුමා හරහා ගෙවීම් සිදු වන බවත් තවම මෙම ව්‍යාපෘතියේ කටයුතු මුල් අදියරේ පවතින බවත් නිවැරදිව මෙම කටයුතු ඉටු විය යුතු නිසා නඩර් ආයතනය රු.20,444.40 මුදලක් ගෙවන ලෙස ඉල්ලා ඇති බවත් ඒ ප්‍රවාහන වියදම්ද එකතුව විය හැකි බවත් කොතැනක හෝ මෙම ව්‍යාපෘතිය ඉදිකිරීම සඳහා මෙය මූලික අඩිතාලමක් බවත් මෙම කටයුත්ත දොළුව,අටබාගේ,ලැඟුම්දෙණිය කොහේ හෝ කළාට අපට ගැටළුවක් නොවන බවත් සඳහන් කරන ලදි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

*මෙහිදි අත් ඔසවා සියළු දෙනාම එකඟතාවය පල කරන ලදි.*

*ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සහා සම්මත වන බව මම සදහන් කරමි.*

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

තීරණ අංක 05.1 (2)

5 (1.2) උඩපළාත ප්‍රාදේශීය සභාවේ භාවිතා කරන අංක 2018/2040 දරණ ඇඟිලි සළකුණු යන්ත්‍රය සදහා වාෂරීක නඩත්තු ගිවිසුම් ගාස්තු මුදල වන රු.11,500.00ක මුදලක් අදාළ සමාගමට ගෙවීම සදහා මහ සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

**ගරු යසස් දෙනුවර මන්ත්‍රීතුමා**

උඩපළාත ප්‍රාදේශීය සභාවේ භාවිතා කරන අංක 2018/2040 දරණ ඇඟිලි සළකුණු යන්ත්‍රය සදහා වාෂරීක නඩත්තු ගිවිසුම් ගාස්තු මුදල වන රු.11,500.00ක මුදල අදාළ සමාගමට ගෙවීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

*මෙහිදි අත් ඔසවා සියළු දෙනාම එකඟතාවය පල කරන ලදි.*

*ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සහා සම්මත වන බව මම සදහන් කරමි.*

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

තීරණ අංක 05.1 (3)

5 (1.3) 2021.12.31 දිනෙන් අවසන් වෂර්යේ භාණ්ඩ සමීක්ෂණයේ නිදෙර්ශ ක්‍රියාත්මක කිරිමේ කමිටුව සදහා ගරු මන්ත්‍රී මණ්ඩලයේ දෙදෙනෙකු,තක්සේරු කිරිමේ කමිටුව සදහා ගරු මන්ත්‍රී මණ්ඩලයේ දෙදෙනෙකු හා වෙන්දේසි කමිටුව සදහා ගරු මන්ත්‍රී මණ්ඩලයේ හතර දෙනෙකු වශයෙන් එම කමිටු සදහා ගරු මන්ත්‍රීවරුන් පත් කිරීම සුදුසු බවටත් ඒ අනුව අදාළ කමිටු සදහා ගරු මන්ත්‍රීතුමන්ලා හා ගරු මන්ත්‍රීතුමියන්ලා පත් කරන ලෙස මම යෝජනා කරමි.

**ගරු යසස් දෙනුවර මන්ත්‍රීතුමා**

2021.12.31 දිනෙන් අවසන් වෂර්යේ භාණ්ඩ සමීක්ෂණයේ නිදෙර්ශ ක්‍රියාත්මක කිරිමේ කමිටුව සදහා ගරු කීතරී රත්නායක මන්ත්‍රීතුමා සහ ගරු කාමරාජන් මන්ත්‍රීතුමා සුදුසු බවට මම යෝජනා කරමි.

**ගරු පාලිත අබේරත්න මන්ත්‍රීතුමා**

තක්සේරු කිරිමේ කමිටුව සදහා ගරු අගලවත්ත මන්ත්‍රීතුමා සහ ගරු ශාන්ත නවරත්න මන්ත්‍රීතුමා සුදුසු බවට මම යෝජනා කරමි.

**ගරු කීතරී රත්නායක මන්ත්‍රීතුමා**

වෙන්දේසි කමිටුව සදහා ගරු උප සභාපතිතුමා,ගරු ශාන්ත නවරත්න මන්ත්‍රීතුමා,ගරු මොහොමඩ් මුරාඩ් මන්ත්‍රීතුමා සහ ගරු ගයානි ශ්‍රියාමාලා මන්ත්‍රීතුමිය සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු උප සභාපති අසේල අමරසේන මහතා

එම යෝජනා සියල්ල  මම ස්ථිර කරමි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

තමා සියළුම ගරු මන්ත්‍රී මණ්ඩලයට මේ වෙනුවෙන් ආරාධනා කරන බව සඳහන් කරන ලදි.

*මෙහිදි අත් ඔසවා සියළු දෙනාම එකගතාවය පල කරන ලදි.*

*ඒ අනුව  එම යෝජනාව ඒකමතිකව සහා සම්මත වන බව මම සදහන් කරමි.*

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

තීරණ අංක 05.1 (4)

5(1.4) ගම්පොල නගර සංවර්ධන සැළැස්ම යටතේ උඩපළාත ප්‍රාදේශීය සභාවට අයත් නාගරික සංවර්ධන අධිකාරි බල ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කර නොමැති 1120-ඉලංගවත්ත, 1121-උනම්බුව, 1128-හපුගස්පිටිය, 1130-රණවල, 1131-බෝවල යන ග්‍රාම නිළධාරි වසම් නාගරික බල ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මොහොමඩ් මුරාඩ් මන්ත්‍රීතුමා

මෙම ග්‍රාමසේවා වසම් කොට්ඨාශ ඉදිරියේදි නගර සභාවටම අයත් වනවා නම් ඉතා සුදුසු බවත් සදහන් කරමින්  උඩපළාත ප්‍රාදේශීය සභාවට අයත් නාගරික සංවර්ධන අධිකාරි බල ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කර නොමැති 1120-ඉලංගවත්ත, 1121-උනම්බුව, 1128-හපුගස්පිටිය, 1130-රණවල, 1131-බෝවල යන ග්‍රාම නිළධාරි වසම් නාගරික බල ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව  මම ස්ථිර කරමි.

ඉලංගවත්ත කොට්ඨාශයේ තමාගේ නිවස ඉදිරිපස හා පිටුපස කොටස් නගර සභාවට අයත් වන බවත් මැද කොටස පමණක් ප්‍රාදේශීය සභාවට අයත් වන බවත් විශාල ලෙස මේ නිසා තමා අපහසුතාවයට පත් වන බවත් මෙම වසර හතරක කාලය පුරාම වීථි ලාම්පුවක් සවි කරගැනිමට නොහැකි වූ බවත් නගර සභා මන්ත්‍රීවරුන්ගේ ඉල්ලීම් වලට එම අවස්ථාවේදීම වීථි ලාම්පු සවි කරන බවත් එවිට ජනතාව තමාගෙන් ඔබතුමාට එසේ කල නොහැකි ඇයි දැයි විමසන බවත් සඳහන් කරන ලදි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

වසර හතරක් පුරා තමා ගරු මන්ත්‍රී මණ්ඩලයට සම සේ මුදල් ප්‍රතිපාදන ලබාදුන් බවත් විථි ලාම්පු විදුලි බල මණ්ඩලයෙන් ගලවා ඉවත් කරන බවත් සඳහන් කරන ලදි.

ගරු  අගලවත්ත මන්ත්‍රීතුමා

අද පුස්සැල්ලාව,පුස්සැල්ලාව ගම,වහුගපිටිය ආදි වසම් දෙකක් නාගරික සංවර්ධන පනත යටතට අයත් වී ඇති බවත් නමුත් ඉලංගවත්ත,රණවල,බෝවල,හපුගස්පිටිය,උනම්බුව ආදි මෙම වසම් පහ සංවර්ධන කමිටුවේදි ගම්පොල නගර සභාවට අයත් වීමට ගරු රාජ්‍ය අමාත්‍ය අනුරාධ ජයරත්න මන්ත්‍රීතුමා ඉදිරිපත් කලේ ගම්පොල නගර සභාවට ඇතුළත් කිරීම සඳහා බවත් මෙහිදි නාගරික සංවර්ධන අධිකාරියට වැරදීමක් වී මෙලෙස ලිපියක් නගර සැළැස්ම ලෙස සකස් කර එවා ඇති බවත් එය එවා ඇත්තේ එම ලිපියේ සඳහන් කර ඇති ආකාරයට අද අපට මෙම වසම් පහ  නාගරික සංවර්ධන අධිකාරියට බලතල අනුව පවරා ගැනීමට බවත් සභාවේ යෝජනා ස්ථිර කිරීමට බවත් නමුත් මෙම යෝජනාව වැරදීමකින් ඉදිරිපත් කර ඇති බැවින් ඊළඟ සභාවට මෙම වසම් පහ ගම්පොල නගර සභා බල සීමාවට ඒකරාශී කිරීමට යෝජනාවක් ක්‍රියාත්මක

වන බවත් අද මෙම යෝජනාව ස්ථිර කර ඊළඟ සභාවට මෙම වසම් පහ ගම්පොල නගර සභා බල සීමාවට ඇතුළත් කිරීමට යෝජනා කරන බවත් මෙය වැරදි අර්ථකථනයකින් ඉදිරිපත් වී ඇති බවත් ලබන සභා වාරයට මෙම කාරණය නිවැරදි වී ලැබෙනු ඇතැයි සඳහන් කරන ලදි.

ගරු යසස් දෙනුවර මන්ත්‍රීතුමා

මෙම සංවර්ධන සැළැස්මට යද්දි දැල්පිටිය හා නවදේව්ට ග්‍රාම සේවා වසම් දෙක නගර සභාවට ආසන්නයේ තිබෙන වසම් දෙකක් නිසා මෙම දැල්පිටිය හා නවදේව්ට වසම් දෙකද මේ සඳහා ඇතුළත් කරන ලෙසට මම යෝජනා කරමි.

ගරු උප සභාපති අසේල අමරසේන මහතා

මෙම යෝජනාව තමා කියවූ බවත් මෙය පහසු දෙයක් නොවන බවත් නගර සභාවට යාමෙන් අපේ උඩපළාතට මෙම වසම් අහිමි වී යන බවත් තමා මෙය හොදක් ලෙස නොදකින බවත් නගර සංවර්ධනය ගත් කල ගම්පොල නගරයට යාබද ප්‍රදේශ ලෙස ඉලංගවත්ත, හපුගස්පිටිය සැලකෙන නිසා නගර සංවර්ධනය කරනවාට තමා කැමති වූ බවත් ප්‍රාදේශීය සභා අණ පනත් යටතේ සභාවට මේ සඳහා බලය තිබෙන බව මෙහි සඳහන් බවත් ඒ අනුව අපට බලතල තිබෙන බවත් එවිට නාගරික සංවර්ධන අධිකාරිය හරහා ගොඩනැඟිලි අයදුම්පත් අනුමත කිරීම ආදි කටයුතු අප හරහා සිදු වන නිසා සභාවේ ආදායම වැඩි වන බවත් වරිපනම් කලාපයක් ලෙස පත්විය හැකි බවත් පුස්සැල්ලාව නගරය වහුගපිටිය ආදි ප්‍රදේශ නාගරික සංවර්ධන අධිකාරිය හරහා සංවර්ධනය කිරීමට යන බවත් කවුරු කලත් මෙය ඉතා හොද බවත් නමුත් උඩපළාත ප්‍රාදේශීය සභාවට අයත් කොටස් ගිලිහෙනවාට තමා දැඩි ලෙස විරුද්ධ බවත් අප සිටියාත් නැතත් බල ප්‍රදේශයේ සීමාව ඊළඟට පත්වන අයෙකු යටතේ තිබිය යුතු බවත් මෙය තමාගේ අදහස බවත් සඳහන් කරන ලදි.

මහ නගර සභාවක් නොකර මෙලෙස බලතල ලැබෙනු ඇතැයි තමා විශ්වාස නොකරන බවත් අපේ බල ප්‍රදේශයේ තිබෙන කොටසක් නගර සභාවට යාමට නොදී රැකගන්නා ලෙසට ඉල්ලීමක් කරන ලදි.

ගරු කිතරී රත්නායක මන්ත්‍රීතුමා

ගම්පොල නගර සංවර්ධනය,පුස්සැල්ලාව නගර සංවර්ධනය යන කාරණා ඉතා හොද කරුණු කාරණා බවත් නමුත් ප්‍රාදේශීය සභා බල සීමාව ටිකෙන් ටික කෙටි වීගෙන යන බවත් තමාගේද නිවසේ දොර ඉදිරිපිට නගර සභා සිමාව බවත් දොර වසා තැබුවොත් ප්‍රාදේශීය සභා සීමාව පවතින බවත් තමාගේ නිවසේ වැටෙන් නගර සභාව වෙන් වන බවත් පාරේ කොටසක් නගර සභාවට අයත් බවත් ප්‍රාදේශීය සභාවට වඩා නගර සභා ආඥා පනත වෙනස් නිසා නගර සභාවට ඇතුළත් වූ ට ජනතාවට ඇති වන ගැටළු වැඩි වන බවත් අපේ ප්‍රාදේශීය සභාවේ හදවත දැල්පිටිය බවත් තමා දැල්පිටිය ප්‍රදේශය ගන්නවාට දැඩි ලෙස විරුද්ධ බවත් ස්ටෝෆීල්ඩ් කොටස නගර සභාවට ගත්තාට ගැටළුවක් නොමැති බවත් අද අංගම්මන,ඩාට්‍රිය ප්‍රදේශ වල ජනතාව පවතින ගැටළු ගැන තමාට පැවසු බවත් තමාගෙ වසම කොබ්බෑවල බවත් නමුත් මේ නගර සභාවට පවරා ගත් ප්‍රදේශ වල මාගර්යක්වත් සාර්ථකව පවත්වාගෙන යාමට නොහැකි වී ඇති බවත් කිරින්ද,ගල්ගෙඩියාව තත්වයද මෙලෙසම බවත් ඒ නිසා විශේෂයෙන් මෙම වසම්ද නගර සභාවට නොගෙන සංවරධනය කිරීමට තමා කැමැත්ත දක්වන බවත් නැතිනම් ප්‍රාදේශීය සභා බල සීමාව කෙටි වන බවත් එය ගැටළුවක් වන බවත් තමාගේ කොට්ඨාශය නම් නගර සභාවට නොගන්නා ලෙසට මම යෝජනා කරමි.

ගරු පාලිත අබේරත්න මන්ත්‍රීතුමා

නාගරික සංවර්ධන පනත යටතේ ගම්පොල නගර සංවර්ධනය සඳහා ඉඩම් පවරා ගැනීමේ කටයුතු සඳහා මෙලෙස කටයුතු කරන බවත් සංවර්ධනය කිරිමේදි ඉඩම් පවරා ගැනීම් ගොඩකිරීම් සිදු කිරීම නාගරික සංවර්ධන පනත යටතේ ඉතාම පහසු වන බවත් නගර සභාවට යනවාද නැද්ද යන්න අපි පසුව තීරණය කල යුතු බවත් දැනට ඉදිරිපත් කර ඇති යෝජනාවට සහයෝගය ලබා දෙමු යැයිද අපේ රටේ නාගරික

ජනගහණය වැඩිවීම හේතු කොට ගෙන නගර සීමා පුළුල් වන බවත් කඩුගන්නාවට තිබූ ප්‍රදේශ දැන් පිළිමතලාව දක්වා පැමිණ ඇති බවත් ඉදිරියේදී ගම්පොල නගර සභාවද දොළුව දක්වා දීසර් විය හැකි බවත් නගර සභාවද ප්‍රාදේශීය සභාවද වැඩි සේවාවක් සපයන්නේ කියා තමා නොදන්නා බවත් ප්‍රාදේශීය සභාවට අයත් එම වසම් 05 නාගරික සංවධර්න අධිකාරිය යටතේ සංවධර්නය කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව තමාද අනුමත කරන බව සදහන් කරන ලදි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

පවරා ගැනීම වෙනම කථාවක් බවත් අපට එවා ඇත්තේ මෙම වසම් 05 ගම්පොල නගර සංවධර්න අධිකාරියට පවරාගෙන සංවධර්නය කිරීමට බවත් ඒ සදහා මහ සභා අනුමැතිය ලබා ගැනීමට ඉදිරිපත් කල බවත් සදහන් කරන ලදි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

*මෙහිදි අත් ඔසවා සියළු දෙනාම එකගතාවය පල කරන ලදි.*

*ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මම සදහන් කරමි.*

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

<u>තීරණ අංක 05.1 (5)</u>

5(1.5) 2021.09.23 වන දින ගරු මහ සභා තීරණ අංක 5(1.6) සංශෝධනය කිරීම යටතේ ජාතික ආධුනිකත්ව හා කාමරීක පුහුණු ආයතනයේ පුහුණු කරුවකු වන අයි.ඒ.ඩී ධනුෂ්ක මධුෂාන් ඉලේපෙරුම මයාට 2021 ඔක්තෝබර් මස සිට දිනකට රු.500.00 බැගින් මාස 06 ක පුහුණු දීමනාව ගෙවීම සුදුසු බවට මම යෝජනා කරමි.

**<u>ගරු කිතරී රත්නායක මන්ත්‍රීතුමා</u>**

තමා දොළුව පුස්තකාලයට ගිය විට මෙම දරුවා දත්ත ඇතුළත් කරනු දුටු බවත් දොළුව පස්තකාලය නවීකරණය කිරිමේදී අපේ ගරු සභාපතිතුමා ඇතුළු කණ්ඩායම එකතුව ඉතාම අලංකාර ලෙස දොළුව පුස්තකාලය සංවධර්නය කර ඇති බවත් ඒ නිසා මෙම අයි.ඒ.ඩී ධනුෂ්ක මධුෂාන් ඉලේපෙරුම නැමැති ජාතික ආධුනිකත්ව හා කාමරීක පුහුණු ආයතනයෙන් එවා ඇති තරුණ මහතාට දිනකට රු.500.00 බැගින් මාස 06 ක පුහුණු දීමනාව ගෙවීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

*මෙහිදි අත් ඔසවා සියළු දෙනාම එකගතාවය පල කරන ලදි.*

*ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මම සදහන් කරමි.*

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

<u>තීරණ අංක 05.1 (6)</u>

5 (1.6) ගොඩවෙල බුම්මලේ ආදාහනාගාරය ඉදිකිරීම සම්බන්ධයෙන් සම්බන්ධීකරණ කමිටුවෙන් එවා ඇති තීරණ මහ සභාවේ දැනගැනීම පිණිස ඉදිරිපත් කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු යසස් දෙනුවර මන්ත්‍රීතුමා

බුම්මලේ මෙම ස්ථානයේ අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ගොඩනැගිල්ලක් ඉදිකිරීමට සැළැස්මක් හෝ මේ වන විට නොමැති නිසා අපි සභාවෙන් කරන්න යන කටයුත්තට මෙලෙස පසුබැසිය යුතු නොවන බවත් අපි ආදාහනාගාරය මෙම ස්ථානයේ ඉදි කලොත් එම අය එතන ගොඩනැගිල්ලක් ඉදි කරනවාද නැද්ද යන්න තීරණය කල යුතු බවත් එම අයගේ කටයුතු වෙනුවෙන් අපි සභාවෙන් කරන කටයුත්ත නතර කල යුතු නොවන බවත් පාසලක් තිබෙනවා නම් අපි ආදාහනාගාරයක් ඉදිකිරීම වැරදි බවත් එසේ නොමැතිව අපේ සභාවේ කටයුතු නතර කිරීම සුදුසු නොවන බවත් මීට පෙර පුස්සැල්ලාව කසළ ප්‍රශ්නයටද වෙනත් අය මැදිහත්වීම නිසා සභාව ඒ සඳහා කටයුතු නොකල බවත් එවිට සභාවේ කටයුතු වෙනත් අයගේ අදහස් නිසා නතර කිරීම තුළින් සභාව අපහසුතාවයට පත් වන බවත් අපේ කටයුතු අපි ඉටු කල යුතු බව තමාගේ අදහස බවත් සඳහන් කරන ලදි.

ගරු කිතරී රත්නායක මන්ත්‍රීතුමා

අපි හා හා පුරා කියා ප්‍රාදේශීය සභාවෙන් ආදාහනාගාරයක් ඉදිකිරීමට යෝජනා කල බවත් ආදාහනාගාරය පිළිබඳව අපි නිතරම සභාවේද,මුදල් කමිටු වලද,අයවැය වාෂර්ීක යෝජනා වලද නිතරම කථා කර සම්මත වී නීත්‍යානුකූලව ආ යෝජනාවක් බවත් බුම්මලේ සුසාන භූමිය ප්‍රාදේශීය සභාව සතු සුසාන භූමියක් බවත් මෙම ස්ථානයේ පාසල සතු ඉඩමක් ½ KM පමණ දුරින් පිහිටා ඇති බවත් ගම්පොල නගර සභාවේ ආදාහනගාරය ශාන්ත ජෝශප් බාලිකා පාසලට යාබදව පිහිටා ඇති බවත් රතනසර විහාරය රන්තැටිය පිරිවෙනද ඊට ආසන්නයේ පිහිටා ඇති බවත් ලංකා බැංකුව ආදි සියළු ආයතන තිබුනත් කුඩා ඉඩ ප්‍රමාණයක ආදාහනාගාරය පිහිටා ඇති බවත් මෙහි වෙනත් දේවල් සිදුවන බව හැගෙන බවත් දොළුව ප්‍රදේශයට ආදාහනාගාරයක් ඉදිකිරීම සභාව නියෝජනය කරන සියළුම මන්ත්‍රීවරුන්ට වැදගත් බවත් ගම්පොල ආදාහනාගාරය නිතර කැඩෙන නිසා දේහයන් පුස්සැල්ලාවට ගෙනයන්න වන බවත් එම කරුණු කාරණා සලකා බලා අපේ ගරු උප සභාපතිතුමා විටින් විට යෝජනාවක්ව මෙය ගෙනා අතර එය සම්මත වූ බවත් පොත්පත් වල මේ සම්බන්ධ තොරතුරු ඇතුළත් බවත් ගොඩවෙල බුම්මලේ තම බිරිදගේ ගම නිසා මෙම ඉඩම පිළිබඳව තමා හොඳින් දන්නා බවත් මෙම ආදාහනාගාරය ඉදිකිරීම නිසා පාසල් ඉඩමට කිසිදු හානියක් සිදු නොවන බවත් මෙහි විදුලි බල මණ්ඩලයේ,අධ්‍යාපන දෙපාතර්මේන්තුවේ,ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයේ ඉඩම්ද තිබෙන බවත් ඒ නිසා මෙතැන කිසිදු ගැටළුවක් නොමැති බවත් අධ්‍යාපන දෙපාතර්මේන්තුවෙන් පාසලක් හැදුවත් ගැටළුවක් නොවන බවත් ගෑස් මගින් කරන නිසා විශාල හානියක් නොවන බවත් ප්‍රදේශයේ සියළු ජනතාව හා තිබෙන මරණාධාර සමිති සියල්ල අපට කැමැත්ත ප්‍රකාශ කල බවත් මෙයින් සභාවට විශාල ආදායම් වැඩිවීමක් සිදුවන බවත් පුස්සැල්ලාවේ සෑදීමට නියමිත බහුකායර් ගොඩනැගිල්ල ඉදිකිරිමේ කටයුතු සඳහා ද මෙලෙස ගියොත් කුමක් සිදුවේදැයි නොදන්නා බවත් ඒ නිසා අපි ගරු අනුරාධ ජයරත්න ඇමතිතුමාට මෙම කටයුත්ත පැහැදිලි කරමු යැයිද එතුමා මෙයට අකමැති නොවනු ඇතැයි සිතන බවද සඳහන් කරන ලදි.මේ සඳහා වෙනත් හස්තයක් ක්‍රියාත්මක වන බව තමාට දැනෙන බවත් ඒ නිසා අපි ගරු නියෝජ්‍ය ඇමතිතුමාට කථා කර මොන බාධක ආවත් මෙම ආදාහනාගාරය ඉදිකිරීම කල යුතු බව තමාගේ අදහස බවත් සඳහන් කරන ලදි.

ගරු උප සභාපති අසේල අමරසේන මහතා

මෙම කටයුත්ත කලත් නැතත් තමාට ගැටළුවක් නොවන බවත් ග්‍රාමීය ප්‍රදේශවල ජනතාවගේ අවශ්‍යතා දුටුව නිසා මෙම යෝජනාව ඉදිරිපත් කල බවත් මෙම ආදාහනාගාරය දොළුවේ හදන්නේ නැතිනම් වෙනත් ස්ථානයක හෝ ඉදිකරන ලෙසත් මෙය ප්‍රාදේශීය සංවධර්න කමිටුවේ කථා කල බැවින් තමාද ප්‍රාදේශීය ලේකම්තුමිය සමඟ සාකච්ඡා කල බවත් ගරු අනුරාධ ජයරත්න මැතිතුමාටද දුරකථනයෙන් කථා කල බවත් මෙහි වැරදි වැටහීමක් පවතින බවත් ගොඩවෙළ හංදියේ සිට කුඩා දුර ප්‍රමාණයක් පවතින බවත් එතැන් සිට පාසල හදන ස්ථානයට තව මීටර් 1000ක් පමණ තිබෙන බවත් දැනට වසර 50කට පමණ පෙර මෙම ඉඩම රැගෙන ඇති බවත් මෙම කරුණු සඳහන් කල පුද්ගලයා වසර ගණනක් දේශපාලනයේ යෙදුනු අයෙකු බවත්

පාසලක් හදනවා නම් එම අයට අඩුම තරමේ මුල්ගලක් හෝ තැබීමට තිබූ බවත් එවන් ආකල්පයක් තමා නොදුටු බවත් දේශපාලන අධිකාරියේ කවුරු හොඳ දෙයක් කලත් තමා එයට සහයෝගය දෙන බවත් අපි සංවධර්න කටයුතු සඳහා උදව් කර ඇති බවත් දේශපාලනයේදි පටු ආකල්ප වලට අපි නොයා යුතු බවත් අපි එසේ නොකරන බවත්  ශාන්ත ජෝශප් පාසල අසල ආදාහනාගාරය තිබෙන බවට ගරු කීතරී මන්ත්‍රීතුමා සඳහන් කල කරුණ නිවැරදි බවත් දොළුවේ ආදාහනාගාරය සෑදීම සුදුසු බවට තමා සඳහන් කලේ වාරියගල, නිල්ලඹ, අටබාගේ, මුල්ගම, ආදි සියළු ප්‍රදේශවල සියළු දෙනාටම මේ සඳහා පැමිණීමට කෙටි මාගර් තිබෙන නිසා බවත් දේශපාලනය කරන විට සංවධර්න කටයුතු සඳහා සහයෝගය දිය යුතු බවත් වෛරී දේශපාලනයකට නොයා යුතු බවත් අපි අද කරන දේවල් වල විපාක ඉදිරියේදි ලැබෙන බවත් එලෙස කටයුතු කරන අයට ගමන කෙටි බවත් තමාගේ යෝජනාව තමා ඉදිරිපත් කල බවත් තමා මේ පිළිබඳව ජනතාව දැනුවත් කරන බවත් අද මෙය කලත් නැතත් තමාට හැකි කාලයක බුම්මලේ ආදාහනාගාරය ඉදිකරන බවත් සඳහන් කරන ලදි.

<u>ගරු ගයානි ශ්‍රියාමාලා මන්ත්‍රීතුමිය</u>

මෙය වසර ගණනාවක් තිබූ පැරණි සුසානභූමියක් බවත් එහි ආදාහනාගාරයක් ඉදි කරනවාට ජනතාව අකමැති බවට මතයක් ඉදිරිපත් කර ඇති බවත් නමුත් එම ප්‍රදේශයේ ජනතාව මෙම ආදාහනාගාරය ඉදිකරනවාට ඉතා කැමැත්තෙන් සිටින බවත් මෙම ක්‍රියාව නතර නොකරන ලෙසට තමා ඉල්ලීමක් කරන බවත් ගල්පිහිල්ල පිට්ටනිය තිබෙන්නේ වැඩි දුරකින් බවත් පිට්ටනියට එහායින් පාසල් ඉඩම ඇති බවත් මෙය ජනාකීණර් ප්‍රදේශයක් නොවන බවත් අපි ජෝශප් විද්‍යාලයේ පාසල් යන කාලේ එහි මිනී පුච්චපු ස්ථාන වලින් දුම් පිට වූ බවත් එවන් පරිසරයක් තිබෙන ස්ථානයක මෙම කටයුතු සිදු වූවාට බුම්මලේ එවන් කිසිදු ප්‍රශ්නයක් නැති බවත් එවන් තැනක ඉදිකිරීමක් සම්බන්ධයෙන් කකුලෙන් නොඇද විරුද්ධ නොවී එම කටයුත්ත ඉටු කිරීමට ඉඩ දෙන ලෙසට ඉල්ලීමක් කරන ලදි.

<u>ගරු පාලිත අබේරත්න මන්ත්‍රීතුමා</u>

අප උඩපළාත ප්‍රාදේශීය සභාවට වැදගත් වන යෝජනාවක් සිදු කරන අවස්ථාවේ මෙම කටයුත්ත දේශපාලනීකරණය කිරිමට සැරසෙන බවක් තමාට හැඟී ගිය බවත් මීට පෙර මේ සඳහා අපි සියළු දෙනා එකඟතාවය ලබාදි මෙම කටයුත්ත කල යුතුය කියන තැන සිටි බවත් අපි කුමන හෝ සංවධර්න ව්‍යාපෘතියක් කරන විට එතන පරිසරය,වැව්ලි සමාගම්,පාසල් ඉඩම් ආදි කුමක් හෝ තිබෙනවා නම් ඒ සම්බන්ධව සත්භාවයෙන් කල්පනා කර අවසර ලබා ගැනීමට ගරු මන්ත්‍රීවරු ලෙස අපි දැනගත යුතු බවත් මෙම කටයුතු වලදි තමන්ගේ නම පැවතිය යුතු යැයි නොසිතා තම තමන්ගේ නමින් සිදු කරන බවට ගොසිප් නොයවා කවුරුන් හෝ කල යුතු බවත් එම ප්‍රදේශයට අයත් මැති ඇමතිවරු සිටින අය සමඟ ද ඒකරාශී ව කටයුතු කල යුතු බවත් තනි ගමනක් දේශපාලනයේ යා නොහැකි බවත් මාගර් සාදන විට එකම ප්‍රදේශයේ මන්ත්‍රීවරු බලය නිසා නිතර එකට ගැටෙන බවත් මෙම කාරණාවත් එලෙසම බවත් මෙහි ගැටෙන්න යමක් නොමැති බවත් ගරු අනුරාධ ජයරත්න මැතිතුමා සම්බන්ධීකරණ කමිටුවේ සිටින නිසා එතුමාද සහයෝගය ලබාදෙනු ඇතැයිද ගරු කීතරී මන්ත්‍රීතුමා සඳහන් කල පරිදි අපි එතුමාට ඉල්ලීමක් ඉදිරිපත් කරමු යැයිද එතුමාගේ ගම නිසා එතුමාද සහයෝගය දෙනු ඇති බවත් මෙය සභාවෙන් කරනවා කියා සභාව විතරක්ම සම්බන්ධ නොවී දැනුවත් කල යුතු අය දැනුවත් කල යුතු බවත් කාටවත් කීතරී නාමය අවශ්‍ය නොවන බවත් අවසානයේ ජනතාවට සේවයක් ලැබෙනවා නම් වඩා වැදගත් බවත් ගරු සභාපතිතුමාගේද දේශපාලන මතවාද ඉවත් කරගෙන මේ සඳහා එකමුතු  කටයුතු කරමු යැයි සඳහන් කරන ලදි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

මෙම ආදාහනාගාරය සාදන තැන දොළුවද කොහෙද කියා තවම තීරණය කර නොමැති බවත් තමා යෝජනාවක් ඉදිරිපත් කලේ අදාළ ආයතන දැනුවත් කර කටයුතු කිරීමට බවත් සඳහන් කරන ලදි.

ගරු ශාන්ත නවරත්න මන්ත්‍රීතුමා

මෙය සම්බන්ධීකරණ කමිටුවේ තීරණයට දැනුවත් කර ඇති බවත් මෙහි ඊළඟ පියවර වන්නේ සම්බන්ධීකරණ කමිටුවේ තීරණ වලට අපට එකඟ වීමට සිදුවීම බවත් එයට අභියෝග කිරීමට අපට අවශ්‍ය නොවන බවත් ඒ නිසා එය නිවැරදි කර ගැනීමට කටයුතු කල යුතු බවත් මහ සභාව ආදාහනාගාරයක් ඉදිකිරීමට තීරණය කර ඇති නිසා ඒ සඳහා සුදුසු ස්ථානයක් නම් කර දෙනවා නම් අපිට එතැනට යා හැකි බවත් අපි සභාවක් ලෙස ගත් තීරණයට සුදුසු ආකාරයට අවස්ථාව ලබා දෙන ලෙසට අපි ඉල්ලීමක් කරමු යැයි සඳහන් කරන ලදි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

*මෙහිදී අත් ඔසවා සියළු දෙනාම එකඟතාවය පල කරන ලදි.*

*ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මම සඳහන් කරමි.*

තීරණ අංක 05.2 (1)

ගරු ජයන්ත කීතරිසිංහ මන්ත්‍රීතුමාගේ යෝජනා

5 (2.1)2014 වෂර්යේ ඉදිකිරිම් කරන ලද කායර්ාල හංදිය පුපුරුස්ස කාපට් මාගර්ය අබලන් විමට ලක්වෙමින් පවතින බැවින් මධ්‍යම පළාත් මාගර් සංවධර්න අධිකාරියට පවරා නඩත්තු කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

දිවංගත ගරු අගමැති දි.මු.ජයරත්න මැතිතුමා සිටින කාලයේ කෘෂි මාගර්යක් ලෙස ජනතාවගේ පහසුව සඳහා කායර්ාල හංදියේ සිට නුවරඑළිය දක්වා කපන ලද මාගර්ය 2014 කාපට් කිරීමට යොමු කල බවත් 2014 කාපට් කරන ලද මාගර්යේ අඩු කොටස් කාපට් වෙමින් පවතින බවත් ඒ අතරේ මෙම මාගර්වල වලවල් සහිත ස්ථාන වල කාපට් ගැලවී ඇති නිසා මෙම මාගර් ප්‍රාදේශීය සභාවටද පළාත් මාගර් සංවධර්නයටද මාගර් සංවධර්න අධිකාරියටද අයත් කියා නොදන්නා බවත් දැනට මාගර්ය නඩත්තු කිරීමක් සිදු නොවන බවත් විටෙක සභාවේ කම්කරුවන් යොදවා මාගර්ය දෙපස පවිත්‍ර කල බවත් සමහර සමිති සමාගම් වලින්ද ශුද්ධ පවිත්‍ර කිරීම් කරන බවත් කෙසේ හෝ වසර 8ක් දැනට ගත වී ඇති බවත් කාපට් ගැලවී යාමෙන් විශාල හානියක් සිදු වන නිසා මෙම මාගර්ය නඩත්තුව සඳහා පළාත් මාගර් සංවධර්න අධිකාරියට පවරා නඩත්තු කිරීමට කටයුතු කරන ලෙසත් එසේ නොමැති නම් සභාවේ යෝජනාවක් ලෙස ප්‍රිමෙක්ස් අපේ සභාවෙන් හදා වැඩ ඒකකයක් සෑදීමට යෝජනා කල බවත් එසේ නම් සභාව මෙම මාගර්ය භාරගෙන ආපදා වලට පත්වන ස්ථාන සකස් කල යුතු බවත් නැතිනම් කෝටි ගාණක් වැය කර සකස් කරන මාගර් විනාශ වූ විට ජනතාවට විශාල අසාධාරණයක් සිදු වන බවත් සඳහන් කරන ලදි.

තවද උඩපළාත බල ප්‍රදේශයේ කාපට් මාගර් සියල්ලද මේ සඳහා ඇතුළත් කරන ලෙසද මම යෝජනා කරමි.

ගරු දිනුක රත්නායක මන්ත්‍රීතුමා

මෙය විශාල ලෙස සැලකීමට භාජනය කල යුතු කාරණයක් බවත් අපිද මෙම තත්වය අත්විදින බවත් විශාල මුදලක් වැය කර සකස් කල නාරංවිට උඩුලැඟුම්දෙණිය හරහා වැවතැන්න මාගර්ය විශාල ලෙස නායයෑමට ලක් වී ඇති බවත් මේ පිළිබඳව අපි සම්බන්ධීකරණ කමිටුවේ කථා කල බවත් සභාවේ යෝජනා ඉදිරිපත් කල බවත් මාගර් සංවධර්න අධිකාරියෙන් මෙම මාගර් එම අයට අයත් නොවන බව සඳහන් කල බවත් මෙම මාගර් අයත් කාටද කියා කවුරුවත් නොදන්නා බවත් අපි ජනතාව ඉදිරියේ අසරණ වන බවත් එවන් ගැටළු මාගර් නඩත්තුව සම්බන්ධයෙන් පවතින බවත් අපට සභාවක් ලෙස කරන්න හැකියාවක් නැතත් පිමෙක්ස් යොදා හෝ කල යුතු බවත් අපි අපේ වේරපිටිය මන්ත්‍රීතුමා මේ අවස්ථාවේ සිහිපත් කරන බවත් අපට කම්කරුවන් නොමැතිවීම විශාල ගැටළුවක් බවත් සඳහන් කරමින් පළාත් මාගර් සංවධර්න අධිකාරියට හෝ

මාගර් සංවධර්න අධිකාරියට මාගර් භාර දී නීත්‍යානුකූලව කටයුතු කිරීම හොද බවට ගෙන ආ යෝජනාව **මම ස්ථිර කරමි.**

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

සභාපති ලෙස මෙම ආසනයේ වාඩි වූවාට කටයුතු කල නොහැකි බව ඔබතුමන්ලාට කවදා හෝ වැටහෙනු ඇති බවත් අපට සභාව සතු මාගර් ටික හෝ පවිත්‍ර කරගැනීමට කම්කරුවන් නොමති බවත් සිටින්නේ හතර පස් දෙනෙකු බවත් නමුත් ඔබතුමන්ලා සභා තීරණ ගත්තත් කටයුතු කරන්නේ කෙලෙසදැයි ගැටළුවක් පවතින බවත් කාපට් කල මාගර් 16ක් පමණ තිබෙන බවත් කවුරු සභාපති වුවත් මෙම මාගර් සභාවෙන් නඩත්තු කිරිමට හැකියාව නොලැබෙන බවත් ඒ නිසා ඔබතුමන්ලාගේ යෝජනා අදාළ ආයතන වෙත තමා යොමු කරන බවත් තුංදෙණිය මාගර්ය සදහා රුපියල් ලක්ෂ පනහක යෝජනාවක් ඉදිරිපත් කර ඇති බවත් සදහන් කරන ලදි.

ගරු උප සභාපති අසේල අමරසේන මහතා

කායර්ාල හංදිය පුපුරැස්ස කාපට් මාගර්ය අබලන් විමට ලක්වෙමින් පවතින බැවින් මධ්‍යම පළාත් මාගර් සංවධර්න අධිකාරියට පවරා නඩත්තු කිරීමට එතුමා යෝජනා කර ඇති බවත් මෙම මාගර්යේ වාහන වලින් තියා පයින්වත් යාමට නොහැකි බවත් ගරු දිනුක මන්ත්‍රීතුමාගේ යෝජනාවයට අනුව එම මාගර් 3ත් ප්‍රාදේශීය සභාවට අයත් බවත් කළුගමුව කාපට් කල මාගර්යේ කුඩා තැනක් අපට හදන්න තිබෙන බවත් එවන් කුඩා කුඩා දේවල් අපි කල යුතු බවත් පළාත් සභාවෙන් මාගර් නඩත්තු කරන බවත් මාගර් සංවධර්න අධිකාරියේ මාගර් විධායක ඉංජිනේරුතුමා හරහා නඩත්තු වන බවත් අපේ මාගර් පමණක් නඩත්තු නොවන බවත් අපි කම්කරුවන් 14 දෙනෙකු බදවා ගත් බවත් එයිනුත් අපට මෙය කල නොහැකි නම් ගැටළුවක් බවත් අපට කාපට් කල මාගර් කිහිපයක් ඇති බවත් අඩි 10 මාගර් අද වන විට අඩි 08 දක්වා පත්වී ඇති බවත් වාහනයක් යන විට වාහන හීරෙන බවත් ඒ නිසා ක්‍රමාණුකූලව යෝජනා ටික ලබාගෙන එක් කොට්ඨාශයකට කම්කරුවන් 05 දෙනෙකු බැගින් යොදවා කටයුතු කරමු යැයි සදහන් කරමින් 2014 වෂර්යේ ඉදිකිරිම් කරන ලද කායර්ාල හංදිය පුපුරැස්ස කාපට් මාගර්ය අබලන් විමට ලක්වෙමින් පවතින බැවින් මධ්‍යම පළාත් මාගර් සංවධර්න අධිකාරියට පවරා නඩත්තු කිරීම සුදුසු බවට **ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි.**

ගරු අගලවත්ත මන්ත්‍රීතුමා

මාගර් පළාත් සභා මාගර් බවට පත් කිරීමට ගරු ජයන්ත මන්ත්‍රීතුමා කල යෝජනාවට අනුව මෙයට පෙර සභා වාර වලදී මධ්‍යම පළාත් සභාවේ ප්‍රවාහන අමාත්‍යාංශයෙන් අපට මාගර් නම් කර එවන ලෙස දන්වා එවා තිබූ බවත් එහිදි අපි ගලහා,දොරගල,මහර,කහවත්ත පාර,මුල්ගම ආදි මාගර් කිහිපයක් මාගර් සංවධර්න අධිකාරියට මධ්‍යම පළාත් සභාවට භාරදුන් බවත් අපට අද විශාල ලෙස ග්‍රාමීය මාගර් කාපට් කර සංවධර්නය කර ඇති බවත් පාර කොහේට අයත් වුවත් අපේ ජනතාව කාපට් මාගර්වල ගමන් කරන බවත් පළාත් සභාව සදහා පවරා ගන්නේ වාහන ධාවනය කරන මාගර් බවත් ගරු ජයන්ත මන්ත්‍රීතුමා ගෙන ආ යෝජනාවත් ගරු දිනුක මන්ත්‍රීතුමා ගෙන ආ යෝජනාවත් මධ්‍යම පළාත් මාගර් සංවධර්න අධිකාරියට ඇතුළත් කර ඇත්තේ එදිරිවීර ගරු ඇමතිතුමා සිටි කාලයේ බවත් මෙම හැම මාගර්යක්ම මධ්‍යම පළාත් සභාවට සංවධර්නය කල නොහැකි බවත් අපි මාගර් නඩත්තු කිරීමට වැඩ පිළිවෙළක් සකස් කරමු යැයිද අපේ ප්‍රිමෙක්ස් හදන යෝජනාව ක්‍රියාත්මක වුවා නම් කැඩෙන පාරවල් අපිට නඩත්තු කරගෙන යා හැකි බවත් එයට ශක්තියක් නොමැති බව පෙනෙන බවත් අපිට ශ්‍රමය මදි බවත් නමුත් ඒ සදහා අපිට කටයුතු කල හැකිදැයි සලකා බලමු යැයි සදහන් කරන ලදි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

*මෙහිදී අත් ඔසවා සියළු දෙනාම එකඟතාවය පල කරන ලදි.*

*ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මම සදහන් කරමි.*

**කමර්ාන්ත යෝජනා**

**ගරු සභාපති ඩී.ජී.ගුණසේන මැතිතුමාගේ යෝජනා**

5 (2.6)බෝවල අඟුරුවල ඩී.ආර්.සී.පී.කේ අබේවධර්න මහතාගේ නිවසට යන මාගර්යේ බැවුම් කොටස සංවධර්නය කිරීම සදහා රු.230,000.00 සුදුසු බවට මම යෝජනා කරමි.

5 (2.7)පුස්සැල්ලාව නගර ශාලාව සංවධර්නය කිරීම සදහා රු.2000,000.00 සුදුසු බවට මම යෝජනා කරමි.

5 (2.8) පුස්සැල්ලාව ලේකම් නිළ නිවාසය සදහා ආරක්ෂිත වැට ඉදිකිරිම සදහා රු.350,000.00 සුදුසු බවට මම යෝජනා කරමි.

5 (2.9)උඩපළාත ප්‍රාදේශීය සභාවේ සහා ගොඩනැඟිල්ල සදහා තීන්ත ආලේප කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

5 (2.10)වජ්ලි ජනපදය හරහා දොරගල පාරේ කාණු පද්ධතිය සකස් කිරීම සදහා රු.200,000.00 සුදුසු බවට මම යෝජනා කරමි.

5 (2.11)මැද කාසල් මිල්ක් මාගර්ය සංවධර්නය කිරීම සදහා රු.300,000.00 සුදුසු බවට මම යෝජනා කරමි.

5 (2.12)කිරිමැටිය බස් නැවතුම්පොල අසළින් ටැංකිය දෙසට යන මාගර්ය සංවධර්නය කිරීම සදහා රු.300,000.00 සුදුසු බවට මම යෝජනා කරමි.

**ගරු ඒ.එච්.ඒ.රත්නායක මන්ත්‍රීතුමාගේ යෝජනා**

5 (2.13)කාසල් මිල්ක් ක්‍රීඩාංගනයේ වොලිබෝල් කෝඩ් එකක් ඉදිකිරීම රු.200,000.00 සුදුසු බවට මම යෝජනා කරමි.

5 (2.14)තුංදෙණිය වසමේ ගන්විලේ සිට තිලකේ මහතාගේ නිවස දක්වා ඇති මාගර්ය සංවධර්නය කිරීම රු.150,000.00 සුදුසු බවට මම යෝජනා කරමි.

5 (2.15)කහවත්ත වසමේ රම්බණ්ඩා මහතාගේ නිවස අසළ සිට ධමෙර් මහතාගේ නිවස දක්වා ඇති මාගර්ය සංවධර්නය කිරීම රු.200,000.00 සුදුසු බවට මම යෝජනා කරමි.

**ගරු ධනුෂ්ක ඉන්ද්‍රජිත් මන්ත්‍රීතුමාගේ යෝජනා**

5 (2.16)මහර ඩිවෙර්ල් කොටසේ ඩී.එම්.අතුල දැල මැදගෙදර මහතාගේ නිවස අසළ සිට ඉතිරි 4කොටස කොන්ක්‍රීට් කිරීම රු.550,000.00 සුදුසු බවට මම යෝජනා කරමි.

**ගරු මුතු නීලමේගම් මන්ත්‍රීතුමාගේ යෝජනා**

5 (2.17)මෙල්ෆට්වත්තේ අංක 04 සහ 05 ලයිම් කාමර වලට යන මාගර්ය සංවධර්නය කිරීම රු.100,000.00 සුදුසු බවට මම යෝජනා කරමි.

5 (2.18)වටගොඩපතන කසාන්ගේ ලයිම් ගෙවල් වලට යන මාගර්ය සංවධර්නය කිරීම රු.100,000.00 සුදුසු බවට මම යෝජනා කරමි.

5 (2.19) මෙල්ෆට් ළමා සංවදර්න මධ්‍යස්ථානය ලගින් ගෙවල් වලට යන මාගර්ය කදිරේෂන් කෝවිලට ඉහළින් සංවධර්නය කිරීම රු.150,000.00 සුදුසු බවට මම යෝජනා කරමි.

5 (2.20)පුස්සැල්ලාව රෝමන් කතෝලික දේවස්ථානය ලඟින් ගෙවල් වලට යන මාගර්ය සංවධර්නය කිරීම රු.100,000.00 සුදුසු බවට මම යෝජනා කරමි.

5 (2.21)නිව් මෙල්ෆට් හවුස් ස්කීම් අමරදාස මහතාගේ නිවස ලගින් ගෙවල් වලට යන මාගර්ය සංවධර්නය කිරීම රු.100,000.00 සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු දිනුක රත්නායක මන්ත්‍රීතුමාගේ යෝජනා</u>

5 (2.22)වැවතැන්න වසමේ දූෂ්‍යන්ත මහතාගේ නිවස අසල මාගර්ය දෙවන අධියර සංවධර්නය කිරීම රු.100,000.00 සුදුසු බවට මම යෝජනා කරමි.

5 (2.23) වැවතැන්න වසමේ ඒ.කේ මහතාගේ නිවස ඉදිරිපිට පැති බැම්ම ඉදිකිරිම රු.250,000.00 සුදුසු බවට මම යෝජනා කරමි.

5 (2.24)නාරංවිට නවින්ද්‍ර මහතාගේ නිවස දෙසට යන මාගර්යේ පැති බැම්ම ඉදිකිරිම රු.200,000.00 සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මොහොමඩ් මුරාඩ් මන්ත්‍රීතුමාගේ යෝජනා</u>

5 (2.25)ඉලංගවත්ත ප්‍රජාශාලාවේ පළවෙනි මහළ ඉදිකිරීම රු.150,000.00 සුදුසු බවට මම යෝජනා කරමි.

5 (2.26)ඉලංගවත්ත රිස්නි මයාගේ නිවස ඉදිරිපිට මාගර්ය සහ බෝක්කුව ඉදිකිරීම රු.100,000.00 සුදුසු බවට මම යෝජනා කරමි.

5 (2.27) උනම්බුව ගෙවල් 20 ඒකනායක මහතාගේ නිවස අසළ මාගර්යේ බෝක්කුව සකස් කිරිම රු.100,000.00 සුදුසු බවට මම යෝජනා කරමි.

5 (2.28) උනම්බුව හුණුගලවත්ත ඒ.එල්.එම්.හාසන් මයාගේ නිවස අසළ මාගර්යේ බෝක්කුව සකස් කිරිම රු.200,000.00 සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු ශාන්ත නවරත්න මන්ත්‍රීතුමාගේ යෝජනා</u>

5 (2.29) කහවත්ත වෙදගෙදර මාගර්යේ පැති බැම්ම ඉදිකිරීම රු.550,000.00 සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු රන්ජන් රාජපක්ෂ මන්ත්‍රීතුමාගේ යෝජනා</u>

5 (2.30)යටිපියන්ගල සුමනසේන මහතාගේ නිවස අසල සිට වසන්ත මහතාගේ නිවස දක්වා ඇති මාගර්ය කොන්ක්‍රීට් කිරීම රු.150,000.00

5 (2.31)ගලත සුසාන භූමිය අසල සිට කවුල්පාන ගම මැද මාගර්ය ඩොසර් කිරීම රු.250,000.00

5 (2.32) නයාපාන සුසාන භූමිය අසලින් නයාපාන ගම මැද මාගර්ය කොන්ක්‍රීට් කර ඇති කොටසේ ඉතිරි කොටස කොන්ක්‍රීට් කිරීම රු.150,000.00 සුදුසු බවට මම යෝජනා කරමි.

**<u>සංශෝධන කමර්ාන්ත</u>**

**<u>ගරු ඩබ්.ප්‍රේමතිලක මන්ත්‍රීතුමාගේ යෝජනා</u>**

5 (2.30)හිල්සයිඩ් ජල යෝජනා ක්‍රමයේ දෙවන අධියර ක්‍රියාත්මක කිරීම රු.200,000.00 කමර්ාන්තය වෙනුවට සංශෝධන කමර්ාන්ත ලෙස,

1) නිල්ලඹ ඉහළ ග්‍රාමය ගම මැද මාගර්ය සංවධර්නය කිරිම රු.250,000.00 සුදුසු බවට මම යෝජනා කරමි.

2) වාරියගල හිල්සයිඩ් මාගර්ය අසළ ජල යෝජනා ක්‍රමය ක්‍රමය ක්‍රියාත්මක කිරීම රු.100,000.00 සුදුසු බවට මම යෝජනා කරමි.

**<u>ගරු ශාන්ත නවරත්න මන්ත්‍රීතුමා</u>**

ඉදිරිපත් කර ඇති කමර්ාන්ත යෝජනා සියල්ල ඉටුකිරීම සුදුසු බවට ගෙන ආ යෝජනා මම ස්ථිර කරමි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

*මෙහිදි අත් ඔසවා සියළු දෙනාම එකඟතාවය පල කරන ලදි.*

*ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මම සදහන් කරමි.*

**<u>ගරු උප සභාපති අසේල අමරසේන මහතා</u>**

**<u>ගරු අගලවත්ත මන්ත්‍රීතුමා</u>**

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

**<u>(6) කාරක සභා වාථර්ා ඉදිරිපත් කිරීම</u>**

1.2022.02.09 දිනැති මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කමිටු වාථර්ාව ඉදිරිපත් කිරීම.

2.2022.02.15 දිනැති ටෙන්ඩර් කමිටු වාථර්ාව ඉදිරිපත් කිරීම.

3.2022.02.09 දිනැති ප්‍රජා සංවධර්න කමිටු වාථර්ාව ඉදිරිපත් කිරීම.

ඉදිරිපත් කර ඇති සියළුම කමිටු වාථර්ා පිළිගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

**<u>ගරු කිතරී රත්නායක මන්ත්‍රීතුමා</u>**

සියළුම කමිටු වාථර්ා පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි.

**<u>ගරු අගලවත්ත මන්ත්‍රීතුමා</u>**

**<u>ගරු උප සභාපති අසේල අමරසේන මහතා</u>**

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

*මෙහිදි අත් ඔසවා සියළු දෙනාම එකඟතාවය පල කරන ලදි.*

*ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මම සදහන් කරමි.*

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

**(7) ආදායම් වියදම් වාර්ථා ඉදිරිපත් කිරීම** -2021 දෙසැම්බර් මස ආදායම් වියදම් වාර්ථාව හා ආදායම් ප්‍රගති වාර්ථාව සභාවට ඉදිරිපත් කරන ලදි

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

2021 දෙසැම්බර් මස ආදායම් වියදම් වාර්ථාව හා ආදායම් ප්‍රගති වාර්ථාව පිළිගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

*ගරු ශාන්ත නවරත්න මන්ත්‍රීතුමා*

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

*මෙහිදි අත් ඔසවා සියළු දෙනාම එකඟතාවය පළ කරන ලදි.*

*ඒ අනුව මෙම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මහ සභාව තීරණය කරන ලදි.*

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

***අද දින සභාවට නොපැමිණි ගරු මන්ත්‍රීතුමන්ලාගේ සහ මන්ත්‍රීතුමියන්ලාගේ නිවාඩු අනුමැතිය සඳහා සභාවට යොමු කරන ලදි.***

*ගරු කීතරී රත්නායක මන්ත්‍රීතුමා*

**අද දින මාසික මහ සභාවට නොපැමිණි සියළුම මන්ත්‍රීතුමන්ලාගේ මන්ත්‍රීතුමියන්ලාගේ නිවාඩු අනුමත කිරිමසුදුසු බවට මම යෝජනා කරමි**

ගරු ගයානි ශ්‍රීයාමාලි *මන්ත්‍රීතුමිය*

**අද දින මාසික මහ සභාවට සහභාගි නොවූ ගරු මන්ත්‍රීතුමන්ලා මන්ත්‍රීතුමියන්ලාගේ නිවාඩු අනුමත කිරිමසුදුසු** බවට ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

*මෙහිදි අත් ඔසවා සියළු දෙනාම එකඟතාවය පළ කරන ලදි.*

*ඒ අනුව මෙම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මහ සභාව තීරණය කරන ලදි.*

**(8) වෙනත්**

**(9) ඉදිරි මහ සභා දිනය තීරණය කිරීම-**

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

ඉදිරි මහ සභා දිනය පවත්නා තත්වය මත තීරණය කරන බව සදහන් කරන ලදි.

**(10) මහ සභාව අවසන් කිරීම**

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

*අද දින මහ සභා වාරය සඳහා සහභාගී වූ ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රී මණ්ඩලයටත් ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයටත් ස්තූතිවන්ත වන අතර යම් යම් දේවල් වලට අපි ගැටුම් ඇති කර ගත්තත් අපි සභාවෙන් පිටතදී සහෝදරත්වයෙන් කටයුතු කරන බවත් ඉදිරියේදී මුදල් ප්‍රතිපාදන ලැබුනොත් වැඩිපුර මුදලක් ගරු මන්ත්‍රී මණ්ඩලයට ලබාදීම සඳහා කටයුතු කරන බවත් දන්වමින් සියළු දෙනාට තෙරුවන් සරණ ප්‍රාර්ථනා කරමින් ප.ව.12.30ට පමණ සභාවේ වැඩ කටයුතු නිමා කරන ලදි.*

*ලේකම්* | *සභාපති*

උඩපළාත ප්‍රාදේශීය සභාව | උඩපළාත ප්‍රාදේශීය සභාව